www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සියදිවි නසා ගැනීම් ශ්‍රී ලාංකික ගොවීන් මුහුන දෙන දුෂ්කර කොන්දේසි පෙන්නුම් කරයි

**Suicides highlight desperate conditions facing Sri Lankan farmers**

**ඩබ්ලිව්. ඒ. සුනිල් විසිනි**
**2005 ජුනි 10**

මාර්තු සහ අප්‍රේල් මාසවල දී දුප්පත් ගම්බද ප්‍රදේශවල එක දිගට සිදු වූ සිය දිවි නසා ගැනීම් ගනනාවක් මගින් ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල ගොවීන් මුහුන දෙන බියකරු සමාජ සහ ආර්ථික කොන්දේසි කෙරෙහි අවධානය ඇද ගනු ලැබ තිබේ. උතුරු මැද පලාතේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීහු තිදෙනෙක් සහ ගොවි බිරිඳක් සියදිවි හානි කර ගත්හ. ඔවුන් සියලු දෙනාම දිවි නසාගෙන ඇත්තේ කෘමි නාශක පානය කිරීමෙනි.

බුද්ධයාය ගමේ 80 වියැති හරමානිස් මාර්තු 6 සහ වැලිකන්ද ගමේ 34 වියැති තිලකසිරි කුලරත්න අප්‍රේල් 16 දිවි නසා ගත්හ. ඔවුන් දෙදෙනාම දිවි නසා ගත්තේ නය ගෙවා ගැනීමට අසමත් වීමේ හේතුව නිසා ය. වසර 18 පෙර උකස් තැබූ සිය කුඹුර බේරා ගැනීමට නොහැකිවීම නිසා රිදී පොකුන ගමේ 49 හැවිරිදි කේ.කේ. ජයරත්න අප්‍රේල් 16 සිය දිවි හානිකර ගත්තේ ය.

ආර්ථික ප්‍රශ්න ගැන සිය සැමියා සමග ඇති වූ ආරවුලකින් පසුව මැදිරිගිරියේ යූ.ඒ. දිලීකා මධුමාලි අප්‍රේල් 12 දිවි නසා ගැනීම තවත් ඛේද ජනක සිද්ධියකි. ඔවුන්ගේ වී අස්වැන්න සුදුසු මිලකට අලෙවි කර ගැනීමට නොහැකි වීම නිසා ඔවුන් කලින් සැලසුම් කර තිබූ ඉඩම් කැබැල්ලක් මිල දී ගැනීමට සහ එලඹෙමින් තිබුන සිංහල-හින්දු අවුරුද්දට අවශ්‍ය ඇඳුම් සහ සෙසු බඩුබාහිරාදිය මිල දී ගැනීමට මෙම අඹුසැමි යුවල අසමත් විය.

ගල් අමුන ගමේ 37 හැවිරිදි ඒ.ආර්.එම්. විජේරත්න ද සිය දිවි හානිකර ගැනීමට උත්සාහ කල නමුත් වාසනාවට ඔහු බේරුනේ ය. දුප්පත් ගොවියෙකුට දරා ගත නොහැකි විශාල බරක් වූ රුපියල් 138,200 පමන ඔහු ගේ නය ඉහල නැග තිබීම ගැන ඔහු සිටියේ කනස්සල්ලෙනි.

මරනවල දේශපාලන බලපෑම කෙරෙහි සැලකිලිමත් වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) ආන්ඩුව සියදිවි නසා ගැනීමට තුඩුදුන් හේතුන් යට ගැසීමට උත්සාහ කලේ ය.

වී අලෙවි කර ගැනීමට නො හැකිවීම නිසා, මෙම ගොවීන් සියදිවි නසා ගත් බව කීම ''අසත්‍යයක්'' යැයි කෘෂිකර්ම ඇමති අනුර කුමාර දිසානායක අප්‍රේල් 22 පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී ප්‍රකාශ කලේ ය.

''එය එක්සත් ජාතික පක්ෂය විසින් දකින අවතාරයක්'' යයි ඔහු පැවසී ය. ඔවුන්ගේ ''පුද්ගලික ප්‍රශ්න'' හේතු කොටගෙන ගොවීන් දිවි නසා ගන්නා බව ඔහු අවධාරනය කල නමුත් එය තව දුරටත් විස්තාරනය කිරීමට ඔහු අසමත් විය. දිසානායක, සිංහල ස්වෝත්තමවාදය සහ ජනතාවාදී පොරොන්දු මත පදනම් වෙමින් කලින් ගැමි දුප්පතුන්ට ආයාචනා කල පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සාමාජිකයෙකි. පලමු වතාවට ආන්ඩු බලයට කරබදු වී සිටින ජවිපෙ එහි සමාජ පදනම වූ ගම්බද පලාත් ද ඇතුලුව වැඩෙන මහජන විරෝධයකට මුහුන දී සිටී.

ප්‍රගතිශීලී ගොවි සම්මේලනයේ (ප්‍රගොස) සම ලේකම් එම්.කේ. ජයතිස්ස, දිසානායකගේ ප්‍රකාශය ''සාපරාධී'' යැයි ක්ෂනිකවම හෙලා දුටුවේ ය. ගොවි සියදිවි නසා ගැනීම් ගැන වචනයක් වත් කතා නොකිරීම ගැන ප්‍රදේශයේ ජවිපෙ පාර්ලිමේන්තු මංත්‍රී එන්.කේ. සුබසිංහ ද විවේචනය කල ඔහු සිය දිවි නසාගැනීම්වලට හේතු විස්තර කලේ යඃ ''ඔවුන් (ගොවීන්) මුහුන දී සිටින ප්‍රධාන ගැටලුවන්නේ නයගැතිකම, දුප්පත්කම සහ සුදුසු මිලකට ඔවුන් ගේ අස්වැන්න විකුනා ගැනීමට නො හැකි වීම යි.''

තද බල නියගයක් නිසා මැයි අස්වැන්නේ සිට අගෝස්තු මාසය දක්වා වූ පසුගිය යල කන්නයේ දී පොලොන්නරුව දිස්ත්‍රික්කයේ බොහෝ ගොවීන්ට සිය වගා කටයුතු කර ගැනීමට නොහැකි විය. නොවැම්බර් සිට අප්‍රේල් දක්වා වූ පසුගිය මහ කන්නයේ දී ඔවුන්ට හොඳ අස්වැන්නක් ලැබුන නමුත් සුදුසු මිලකට වී විකුනා ගැනීමට ගොවීන්ට නුපුලුවන් විය. ''වගා කිරීමට පමනක් නොව, ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීමට පවා ඔවුන්ට මුදල් නැහැ''යි ජයතිස්ස පැවසී ය.

දරිද්‍රතාව, විරැකියාව සහ ඌන රැකියා නියුක්තිය පලල්ව පැතිරී ඇත. දිනකට ඩොලර් එකකට (රුපියල්

100ට) වඩා අඩුවෙන් ඉපයීම අඩු ආදායමක් යයි ගත හොත් ජනගහනයෙන් සියයට 24.7ක් දරිද්‍රතා රේඛාවේ මට්ටමෙනුත් පහල ජීවත් වෙති. කෙසේ නමුත් ඩොලර් 2ක් (රු. 200) දෛනික ආදායම විශේෂ සීමාවක් ලෙස ගත හොත් සමහර ග්‍රාමීය දිස්ත්‍රික්කවල දරිද්‍රතා රේට්ටුව සියයට 50 ඉක්මවයි. ග්‍රාමීය පලාත්වල ජනයාගෙන් තුනෙන් දෙකකට වඩා සංඛ්‍යාවකට විදුලිය පහසුකම් ද ජනයාගෙන් භාගයකට ආරක්ෂිත ජලය හෝ සනීපාරක්ෂක වැසිකිලි පහසුකම් නැත.

අඛන්ඩව සිදුවන සියදිවි නසා ගැනීම් තුල ඒවායේ ඛේදනීය ප්‍රකාශනය අත් කර ගන්නා දැවැන්ත පීඩනයක් මෙම රුදුරු කොන්දේසි විසින් නිර්මානය කරනු ලබයි. සෞඛ්‍ය අමාත්‍යංශයේ සංඛ්‍යාලේඛනවලට අනුව ග්‍රාමීය ප්‍රදේශවල සිය දිවි නසා ගැනීමේ රේට්ටුව ඉතා ඉහල මට්ටමක පවතී. වී වගා කරන දිස්ත්‍රික්කවල ජනගහනයෙන් ලක්ෂයකට සමස්ථ සියදිවි නසාගැනීම් 2000 දී 34.33, 2001 දී 34.83, 2002 දී 31.41, 2003 දී 29.04 සහ 2004 දී 35.91 කි.

1994 සිට බැංකුවලට ඇති සියලුම ගොවි නය අහෝසි කිරීම, බැංකුවලට උකස්කර තිබෙන රන් ආභරන වෙන්දේසි කිරීම අත්හිටුවා උකස් නය සඳහා වූ පොලිය කපා හැර වාරික වසයෙන් උකස් නය ගෙවීමට ඉඩ ලබා දීම, නිෂ්පාදන මිලට සරිලන සේ වී කිලෝවක සහතික මිල ඉහල දැමීම සහ වී අස්වැන්න මිල දී ගැනීම සඳහා ආන්ඩුවේ ස්ථිර මිල දී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවන ලෙස ගොවි සංවිධාන ඉල්ලා සිටිති.

## මිල පහත වැටීම

වර්තමානයේ දී ආන්ඩුව, වී කිලෝවකට රුපියල් 15 සිට 16 දක්වා වූ මිලක් ගෙවයි. නමුත් බොහෝ ගොවියන්ට මෙය නො ලැබෙයි. මහ කන්නයේ අස්වනු නෙලීම පෙබරවාරි මාසයේ අගදී ආරම්භ කෙරුන නමුත් ආන්ඩුවේ වී මිලදී ගැනීම පටන් ගැනුනේ මාර්තු අග දී ය.

විරෝධතා පටන් ගැනුන විට වී අස්වැන්න මිල දී ගන්නා බවට මහා ඝෝෂාවක් සහිතව නිවේදනය කල නමුදු ඒ සඳහා ආන්ඩුව වෙන් කලේ රුපියල් මිලියන 750 (ඇ.ඩො. මිලියන 7.5) පමනි. මෙම මුදල මහ කන්නයේ ඇස්තමේන්තුගත නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් මිලියන 2.2න් සියයට 10 පමන ප්‍රමානයක් පමනක් මිලදී ගැනීම් සෑහෙයි.

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පමනක් ඇස්තමේන්තු ගත නිෂ්පාදනය වී මෙට්‍රික් ටොන් 215,000. කෙසේ නමුත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුව මැයි 9 වන විට මිල දී ගෙන තිබුනේ මෙට්‍රික් ටොන් 20,000 පමනි. ප්‍රමානවත් තරම් මිලදී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවා නැති අතර පවතින පහසුකම් ද ප්‍රමානවත් නැත. අවශ්‍ය තරම් තරාදි, බෑග් සහ තෙත මාපක මෙන්ම ගබඩා කිරීමේ සහ ප්‍රවාහනය කිරීමේ පහසුකම් ද හිඟ ය.

තෙතමාපකය වී විකුනා ගැනීමට අපහසුවීමේ ගැටලුවේ වැදගත් කරුනකි. තෙතමනය සියයට 14 ඉක්මවයි නම් ආන්ඩුවේ මිලදී ගැනීමේ මධ්‍යස්ථානය වී මිලදී නො ගනී. කෙසේ නමුත් බොහෝ තෙතමාපක නිසියාකාරව ක්‍රියා නො කරන බවට ගොවීහු චෝදනා කරති.

ආන්ඩුවේ මිලදී ගැනීමේ මධ්‍යස්ථානවලට තම අස්වැන්න විකුනා ගැනීමට ගොවීන් අසමත් වුවහොත් කිසි අනුකම්පාවක් නැති දුෂ්ට පුද්ගලික ව්‍යාපාරිකයන්ට සහ වී මෝල් හිමියන්ට කිලෝවක් රුපියල් 10-11 තරම් අඩු මිලකට සිය වී අස්වැන්න විකිනීමට ඔවුන්ට බල කෙරෙයි. ප්‍රධාන වී මිල දී ගන්නන්ගෙන් සමහරු රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට, යූඑන්පිය සහ පාලක එජනිස ආන්ඩුවේ ප්‍රධාන පක්ෂය වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සමඟ සම්බන්ධකම් ඇතිවුන්ය.

මුදල් හැකියාව අතින් ගොවීන් ඉන්නේ ඉතා අඩමාන දුර්වල තත්වයක ය. කුඹුරු හෙක්ටයාර් එකක් වගා කිරීම සඳහා ඔවුන්ට රුපියල් 50,000 වඩා වැය වන අතර අස්වනු නෙලා විකිනීමට මාස හයක් ඔවුන් බලා සිටිය යුතුය. ආන්ඩුවේ මිලට ඔවුන්ට තම වී අස්වැන්න විකුනා ගැනීමට ලැබුනොත් හෙක්ටයාර් එකකින් රුපියල් 80,000-90,000 ආදායමක් ඔවුන්ට ලැබෙයි. නිෂ්පාදන වියදම අඩුකල විට මාස 6ක් සඳහා ඔවුන්ට ලැබෙන ආදයම රුපියල් 30,000 හෙවත් මාසයකට රුපියල් 6,000 කි.

බොහෝ ගොවීන්ට ඇත්තේ හෙක්ටයාර් එකක් හෝ ඊට අඩු කුඹුරු ඉඩම් ප්‍රමානයකි. බොහෝ අවස්ථාවලදී පවුලක් ව්‍යාප්ත වී ඇති විට යලි යලිත් එහි සාමාජිකයන් අතර ඉඩම බෙදී යයි. එමෙන්ම දුගී ගොවීන්ට බිත්තර වී, පොහොර, කෘෂිරසායනික සහ සෙසු බඩු භාන්ඩ සියයට 20 දක්වා වන තරම් අසාධාරන පොලී රේට්ටුවලට නයට ගැනීමට සිදුවෙයි. ඔවුන් ගේ වී අස්වැන්න සඳහා නිසි මිලක් නැතිව ආහාර, රෙදි වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පවා නයට ගැනීම මගින් වඩ වඩා නය ගැතිවීම නිසා ගොවීහු මූල්‍ය උගුලක සිර වී සිටිති.

නය ගැනීම සඳහා රත්තරන් බඩු සහ ටී. වී, බයිසිකල්, මහන මැෂින් ඇතුලු ගෘහ උපකරන සහ කෘෂි උපකරන පවා ගොවීන් උකසට තැබිය යුතු ය. හිගුරක්ගොඩ ප්‍රදේශයේ එක් තොග වෙලඳ සැලක පමනක් අත් ට්‍රැක්ටර් 600 ක් සහ රොටරි ගොවීන් විසින් උකසට තබා ඇත. මේ සියල්ල උකස් තබා ඇත්තේ හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා ය.

## නිදහස් වෙළඳ පොල ප්‍රතිපත්ති

1950 ගනන්වල සිට 1970 ගනන් දක්වා බලයට පත් වූ ආන්ඩු ඔවුන්ගේ ''ජාතික ස්වයං පෝෂන''ආර්ථික පිලිවෙතේ මූලික අංගයක් ලෙස වී නිෂ්පාදනය ප්‍රසාරනය කලේ ය. මෙහි එක් ප්‍රධාන අරමුනක් වූයේ සහල් ආනයනය කපා හැරීම මගින් වෙළඳ ශේෂ හිඟය අඩු කිරීම ය. දකුනු තෙත් කලාපයේ සහ මධ්‍යම කඳුකර දිස්ත්‍රික්කවල ගැමි පවුල් දසදහස් ගනනක් උතුරු මැද සහ උතුරු නැගෙනහිර වියලි කාලාපවල පදිංචි කරවනු ලැබූහ. ඔවුන්ට ඉඩම්, නිවාස, සහ පොහොර සහනාධාර මෙන්ම මූලික කෘෂි උපකරන, බැංකු නය සහ පලමු අස්වැන්න නෙලා ගන්නා තුරු ආහාර සලාක ආන්ඩුව මගින් සැපයී ය. මෙම උපකාර සීමා සහිත වූ අතර මෙම ප්‍රදේශවල පදිංචිව සිටින්නෝ තවමත් බරපතල දුෂ්කරතාවලට මුහුන පා සිටිති.

කෙසේ නමුත් 1970 ගනන්වල මැද භාගයේ දී මුහුන දුන් තියුනු ආර්ථික අර්බුදයන් 1977 අග භාගයේ දී විවෘත ආර්ථික පිලිවෙත්වලට නැඹුරු වූ යූඑන්පී ආන්ඩුව ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝග යටතේ පැරනි ජාතික ආර්ථික නියාමක තන්ත්‍රය බිඳ දැමීම ආරම්භ කලේ ය. වැඩි දියුනු කෙරෙන සීමාවකින් තොර වෙළඳපොල ක්‍රියා කාරිත්වය ගොවීන් මත විනාශකාරි බලපෑමක් ඇතිකර තිබේ.

රුපියලේ අගය පහත වැටීම සහ ශ්‍රී ලංකා ආර්ථිකය විවෘත කිරීම නිසා මූලික අත්‍යවශ්‍ය භාන්ඩවල පමනක් නොව, ගොවි උපකරන සහ නිෂ්පාදන ද්‍රව්‍යවල මිල ද අහස උසට නැග තිබේ. 1980 ගනන්වල දී යූඑන්පි ආන්ඩුව පොහොර සහනාධාරය කපා හැරීම ආරම්භ කලේ ය. ජල බද්දක් ද පැනවී ය. ගොවීන්ට උපකාර කිරීම සඳහා වූ ආන්ඩුවේ ආයතනවල ක්‍රියාකාරිත්වය එක්කෝ කප්පාදු කර ඇත නැත හොත් එම ආයතන අහෝසි කර ඇත.

ඔවුන් ගේ නගරවල සහ ගම්වල දියුනුවක් නැතිකමින් වඩාත්ම පහර කෑවේ ගම්බද තරුන ජනයා ය. රටේ ලාබ ශ්‍රමය සූරාකෑම සඳහා පිහිටුවා ඇති නිදහස් වෙළඳ කලාපවල රැකියා සොයා බොහෝ දෙනා නගරවලට සංක්‍රමනය වෙති.

විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) කුඩු කිරීම සඳහා යූඑන්පී ආන්ඩුව විසින් 1983 පටන් ගැනීමෙන් පසු දැවැන්තව ප්‍රසාරනය කෙරුන මිලිටරියට බැඳීමට සෙසු අයට බල කෙරුනි.

යුද්ධය අවසන් කිරීම ප්‍රජාතන්ත්‍රීය අයිතීන් යලි තහවුරු කිරීම සහ ජීවන තත්වයන්, විශේෂයෙන් ම ගැමි ජනයාගේ ජීවන තත්වයන් ඉහල දමන බවට පොරොන්දු වෙමින් 1994 දී ජනාධිපති කුමාරතුංගගේ පොදු පෙරමුනු (පොපෙ) ආන්ඩුව බලයට පත් විය. නමුත් ගැමි නයගැතිකම අහෝසි කිරීම සඳහා පොදු පෙරමුනු ආන්ඩුව ක්‍රියාවට දැමූ සීමිත පියවරයන් ක්ෂනිකව ම තවත් නිදහස් වෙළඳපොල පිලිවෙත්වලට මාවත පෑදී ය. වී මිලදී ගැනීම සඳහා 1972 පිහිටු වූ වී අලෙවි මංඩලය 1996 දී පොපෙ ආන්ඩුව අහෝසි කලේ ය. ආන්ඩුවේ හාල් මෝල් ද ක්‍රමානුකූලව වසා දැමී ය.

2002 බලයට පැමිනි යූඑන්පීය නායකත්වය දුන් සන්ධාන ආන්ඩුව සහ වර්තමාන එජනිස ආන්ඩුව එම පිලිවෙතම පෙරට ගෙන යයි. මැතිවරන කාලය තුලදී මෙම දෙකම එම මොහොතෙහි බලය සිටින ආන්ඩුව හෙලාදකිමින් ගැමි දුප්පත්කම අහෝසි කිරීමට පොරොන්දු දෙන නමුත් බලයට පැමිනි වහාම එම පොරොන්දු ඉවත දමනු ලබයි. පොහොර සහනාධාරය කැපීම සහ ගොවීන්ගේ ප්‍රශ්න නොතැකීම ගැන විශේෂයෙන් ජවිපෙ මැතිවරනයට පෙර යූඑන්පීයට පහර ගැසුවේ ය.

නමුත් සන්ධාන ආන්ඩුව තුල ග්‍රාමීය ප්‍රදේශවලට සම්බන්ධ අමාත්‍යංශ ගනනාවක් අල්ලා ගෙන සිටින ජවිපෙ යූඑන්පී ට වඩා තරමක් වෙනස්ව එම පිලිවෙත්ම පෙරට ගෙන යයි. බලයට ඒමත් සමඟ එජනිස ආන්ඩුව යූරියා සඳහා පොහොර සහනාධාරය යලි ක්‍රියාත්මක කල නමුත් සෙසු පොහොරවල මිල ඉහල දැමී ය. උදාහරන වසයෙන් ඩයිඇමෝනියම් පොස්පේට් සහ පොටෑෂ් පොහොර (මඩ පොහොර සහ කැට පොහොර) කිලෝ 50ක බෑගයක මිල පිලිවෙලින් රුපියල් 1050 සිට 1550 සහ රුපියල් 1025 සිට 1525 ඉහල දැමුනි.

බොහෝ ගොවිජන සංවිධාන එක් හෝ තවත් දේශපාලන පක්ෂයකට සම්බන්ධිත ය. තමන් ස්වාධීන යැයි කියා ගන්නා සංවිධාන බලයේ පවතින ආන්ඩුවට පීඩනය යෙදීමට සීමා වෙති. කෙසේ නමුත් දශක දෙකක ආර්ථික ''ප්‍රතිසංස්කරන'' පෙන්නුම් කර ඇත්තේ ප්‍රධාන පක්ෂ දෙකෙන් එකකට වත් ග්‍රාමීය ප්‍රදේශවල ගැඹුරුවන අර්බුදයට විසඳුමක් නැති බව ය. ගොවීන් ගේ පීඩනයට නැමෙනවා වෙනුවට බලයට පත් හැම ආන්ඩුවක්ම ක්‍රියාවට දමා ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනයේ නියෝග ය. මෑත සියදිවි නසා ගැනීම් මෙම පිලිවෙත් මගින් ඇති කෙරුන බියකරු ආදීනවවලින් එකක් පමනි.

© www.wsws.org